සැ. යු.- (i) 2013.10.11 දින පළ වූ අංක 1,832 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,833 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1638 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1643 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. ඩී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ අමාත්‍යාංශය

### කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) තනතුරු

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති කම්කරු විනිශ්චය සභා කාර්යාල වල පුරප්පාඩුව පවතින ලඝුලේඛක (සිංහල) තනතුරු 58ක් සහ ලඝු ලේඛක (ඉංග්‍රීසි) තනතුරු 01ක් සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සම්මාන 04ක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ එකම වාරයක දී යටත් පිරිසෙයින් විෂයයන් 5ක් සහිත, දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 6කට නොඅඩු ගණනකින් අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය සමර්ථව සිටිය යුතු අතර, භාෂාව ඇතුළුව සම්මාන 4ක් සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතයට හෝ වාණිජ අංක ගණිතයට හෝ මූලික ගණිතයට හෝ සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

02. *වෘත්තීය සුදුසුකම් :*

පිළිගත් ආයතනයක ලඝු ලේඛනය පිළිබඳ මාස 6කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

03. *කායික සුදුසුකම් :*
1. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදීමට තරම් යෝග්‍ය යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම;
2. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට තරම් ශාරීරික යෝග්‍යතාවයකින් විය යුතු ය.

04. *වෙනත් :*
1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය;
3. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

05. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

06. *වැටුප් පරිමාණය :*
එම්එන් 1 -2006ඒ
මාසයකට රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

07. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අධිකරණ අමාත්‍යාංශ ලේකම් හෝ බලය පවරන වෙනත් ආයතනයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු මත කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගනු ලැබේ.

08. *රාජකාරි ස්වභාවය.*—කම්කරු විනිශ්චය සභාවේ නඩු සටහන් ලඝුලේඛනය කර යතුරු ලියනය කිරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරන අනෙකුත් කාර්යයන්.

09. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය;

(ආ) මෙම තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග වසරකට දෙවරක් අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලැබේ.

10. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කර කත් අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, 2013.11.08 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක (සිංහල)/(ඉංග්‍රීසි) තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

11. *විභාග ගාස්තු :*
විභාග ගාස්තු වශයෙන් රු. 300 ක මුදලක් "ලේකම්, අධිකරණ අමාත්‍යාංශය" නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001-9-9025-184 දරන ගිණුම් අංකයට බැරවන සේ සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතු ය. මුදල් ගෙවන ලද ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

12. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය :*

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| භාෂා දැනුම | 10 |
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට ඇති ප්‍රවීණතාවය | |
| පරිගණක දැනුම | 15 |
| පළපුරුද්ද | 40 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| එකතුව | 100 |

13. ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

14. යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.

කමලිනි ද සිල්වා,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අධිකරණ අමාත්‍යාංශය**

***කම්කරු විනිශ්චය සභා ලසුලේඛක (සිංහල/ඉංග්‍රීසි) තනතුරු***

අංකය :—————.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම :- සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

02. මුලකුරු සමග නම :- සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

03. පුද්ගලික ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

04. කාර්යාලයීය ලිපිනය :—————.

05. දුරකථන අංකය :—————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

07. උපන් දිනය :—————.

08. 2013.11.08 වැනි දිනට වයස :

අවු. :—————. මාස :—————. දින :—————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

10. ජාතිය :—————.

11. ඉගෙනගත් භාෂා මාධ්‍යය :—————.

12. අයදුම්කරන්නේ ලසුලේඛක '(සිංහල) තනතුර' ද, '(ඉංග්‍රීසි) තනතුර' ද යන වග :—————.

13. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය/ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

14. වෘත්තීය සුදුසුකම් :—————.

15. පළපුරුද්ද :—————.

16. වෙනත් සුදුසුකම් :—————.

17. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බැව් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දැන සිටිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................... යන අය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය ඉහත කී තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

10-513

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2013**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරු 07ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම්, 2013.11.15 වැනි දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

1.1 මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

1.2 මෙහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 06 යටතේ සඳහන් ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *සුදුසුකම් :-*

2.1 *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*
(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම;
*හෝ*
(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

2.2 *පළපුරුද්ද :*
(i) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයෙකු වශයෙන් වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

2.3 *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

2.4 *වෙනත් :*
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි පිළිබඳව හා සේවා කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර I වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබාගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.02.15 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සේවයේ I වැනි පන්තියට පත් කරනු ලැබේ.

(vi) තෝරාගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

04. *වයස් සීමාව :-*
අපේක්ෂකයන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි SL 1 - 2006 වැටුප් කාණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | 20 |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | 15 |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. | **අතිරේක පළපුරුද්ද :** | | 30 |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන | | |

| *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|
| නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර) | | |
| (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| 04. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :** | | 15 |
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය /උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය) | 15 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| 05. **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | 15 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| රජයේ පිළිගත් ආයතනයක මාස 06කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| රජයේ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| 06. **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව :** | | 05 |
| **මුළු ලකුණු :** | | 100 |

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

7.2 සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

7.3 සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

08. *අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 9 දක්වා පළමු පිටුවේද, 10 සිට 14 දක්වා දෙවන පිටුවේද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක).

8.2 සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2013.11.15 වැනි දිනට හෝ එදිනට ප්‍රථම හෝ ලැබෙනු පිණිස කොළඹ 05, කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වමත් පස ඉහල කෙළවරෙහි "කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2013" යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසු ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.3 අයදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකරුවකු/ දිවුරුම් කොමසාරිස්වරයකු /නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 22,935ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :-*

අපේක්ෂකයකු තම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු, අසත්‍ය හෝ වැරදි තොරතුරක් පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

* කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

* මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය,
කම්කරු මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණිය) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2013

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : (SILVA, A. B.)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.4 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.5 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී - 1) :
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

04. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. 6.1 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

6.2 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවු : මාස : දින :

07. දුරකථන අංකය :

08. 8.1 නීතිවේදී උපාධිය ලද වර්ෂය :————.
8.2 විශ්ව විද්‍යාලයය :————.
8.3 සාමාර්ථය :————.
8.4 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :————.

09. 9.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් වර්ෂය :————.
9.2 අයදුම්පත් කැඳවන අවසාන දිනට නීතිඥයෙකු ලෙස පළපුරුද්ද : අවු. :————.

10. 10.1 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :————.

10.2 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :————.

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

12. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටිය දී සේවය අවසන් කර තිබේ ද?

එසේ නම් විස්තර හා සේවය අවසන් කිරීමට හේතු ? :————.

13. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගැනීමට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 08 ඡේදයේ 8:3 පරිදි විය යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ............... දින මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

10-607

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### මනෝ විද්‍යාඥ (ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 01 සේවා ගණයේ) තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සඳහා මනෝ විද්‍යාඥ II වැනි ශ්‍රේණියේ තනතුරු 24ක් සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමුකිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(1) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :
*අධ්‍යාපන සුදුසුකම්*

* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමඟ මනෝ විද්‍යාව සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

සහ

* අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

සහ

*වෘත්තීය සුදුසුකම්*

* රජය පිළිගත් වෛද්‍ය ආයතනයක සායනික මනෝ විද්‍යාව පිළිබඳ (Clinical Psychology) වසර 02ක පුහුණුවක් ලබා තිබීම;

සහ

* මනෝ වෛද්‍ය විශේෂඥවරයෙකුගේ අධීක්ෂණය යටතේ මාස හයක (06) පුහුණුවක් ලබා තිබීම.

(ii) කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) වෙනත් :

* ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

* අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.
(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳි වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබාගත යුතුය.
(iv) වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.
(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව :*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු. 17,680-10x320-11x365-15x450-31,645 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (MN 06 - 2006A)

06. ලිඛිත පරීක්ෂණය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ දැනුම | මානසික සෞඛ්‍ය හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. | පැය 03 | 100 | 40% |

අයදුම්පතෙහි ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මඟින් රු. 500 ක විභාග ගාස්තුව සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතුය. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*
ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. (*අ*) අයදුම්පත් 2013.09.15 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
[අධ්‍යක්ෂ (පාලන) 06 ශාඛාව],
සෞඛ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(*ආ*) ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් දෙවන පිටුව අංක 07 සිට 09 දක්වාත් ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කල යුතුය.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "මනෝ විද්‍යාඥ තනතුරු සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,73,060 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කල යුතුය.

(ඊ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.
- මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටළු සඳහා සෞඛ්‍ය ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

2013 සැප්තැම්බර් මස 21 වැනි දින.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ මනෝ විද්‍යාඥ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම**

*ආදර්ශ අයදුම්පත්‍රය*

පදිංචි දිස්ත්‍රික්කය : [ ] භාෂා මාධ්‍ය : [ ]
(සිංහල - 01/දෙමළ - 02/ඉංග්‍රීසි - 03)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

01. 1.1 අයදුම්කරුගේ මුල්'කුරු සමඟ නම : Mr./Mrs./Miss :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : Mr./Mrs./Miss. SILVA A.B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ලිපිනය (රාජකාරි) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 ලිපිනය (රාජකාරි) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නියුක්ත නිලධාරියකු ඔහුගේ රාජකාරි ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

03. 3.1 උපන් දිනය :
වර්ෂය :———. මාසය :———. දිනය :———.

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————.මාස :————. දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

05. ස්ත්‍රී/පුරුෂභාවය :—————.

06. සුදුසුකම් :
(නිවේදනයේ 02 ඡේදය යටතේ වන සුදුසුකම්)

අධ්‍යාපන සුදුසුකම් : ....................................
....................................
....................................
....................................

පළපුරුද්ද : ....................................
....................................
....................................
....................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
7.2 ලදුපත් අංකය හා දිනය :—————.
7.3 ගෙවූ මුදල :—————.

| විභාග ගාස්තු ගෙවන ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

08. අයදුම්කරුගේ සහතිකය ፡

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ፡

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

—————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

10. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :- (රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය පමණි)

මෙම ඉල්ලුම්කරු වන .............................. මයා/ මිය/ මෙනවිය, මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ .............. වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර .............. ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බවද, ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද ............... දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.

තනතුර :—————.
දිනය :—————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————.

(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

10-421

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2013

### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. 2013 වසරට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජනවාරි මස හෝ පෙබරවාරි මස හෝ සති අන්තයක දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන.*—උපලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටවනු ඇත.

එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයෙහි දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය.*—මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්.*—මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම;

*හෝ*

4.2 ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය සහිතව සමත් වී සිටීම;

*හෝ*

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශිෂ්‍ය විභාගයේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

*සටහන.*— (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයෙකු, පරිවේණාධිපතිවරයකු හෝ විද්‍යාලයාධිපතිවරයකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසැල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම* :

5.1 *දහම් පාසැල් අයදුම්කරුවෝ.*—පසුගිය වසරේ හෝ ඊට පෙර වසරවල සිසුන් ඉදිරිපත් කළ සියලු ම දහම් පාසැල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු යම් දහම් පාසැලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යන විස්තර සඳහන් කොට මෙහි 5. 6 වැනි ඡේදයේ සඳහන් ලිපිනයට 2013.11.05 වැනි දිනට පෙර දැන්විය යුතු ය.

5.2 *බාහිර අයදුම්කරුවෝ.*—1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසැල මගින් රුපියල් 150 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු ම දහම් පාසැල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසැල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසැල් ප්‍රධානියා වෙත තබා ගත යුතු ය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.4 අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2013.11.18 වැනි දින වේ.

5.5 අයදුම්පත්වල අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී, මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිළිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළයුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර, දහම් පාසැල් ප්‍රධානාචාර්යවරයා සෘජුවම සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දහම් පාසැල් අවසාන සහතික පත්‍ර විභාගය - 2013" යනුවෙන් ද, **ඉල්ලුම් කරන නගරය** ද සඳහන් කළ යුතු ය.

5.8 කිසිදු සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන පරිවේණාධිපතිවරයා, හෝ ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා හෝ වගකිව යුතු ය.

5.10 විභාගයට ඉල්ලුම් කරන ලද සෑම අයදුම්කරුවෙකුම, ඉල්ලුම් පත්‍රයේ සම්පූර්ණ කර ඇති තමාගේ සියලුම තොරතුරු නිවැරදිද යන්න පෞද්ගලිකවම පරීක්ෂාකර බලා අත්සන් කළ යුතු ය.

5.11 ඇයදුම්කරුවන් අත්සන් කර නැති, මකන දියර භාවිතා කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත ඉල්ලුම් පත්‍ර මෙන්ම ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා නියමිත සම්පූර්ණ විභාග ගාස්තුව රුපියල් 150 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසැල් අයදුම්කරුවන් පමණක් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලුම් කරන විෂයයට විභාග ගාස්තුව රුපියල් 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*—දහම් පාසැල් ප්‍රධානාචාර්ය විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු ම අයැදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා, එක් ලදුපතක් ලබාගෙන, එම ලදුපත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.).

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*—කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන විභාග ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර.*—විභාගයට ඇතුළත් කරගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසැල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත එය ඉදිරිපත් කළ යුතු ය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසැල් ප්‍රධානාචාර්යවරයකු හෝ පරිවේණාධිපතිවරයකු හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,40,360 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට නියමිත දිනට සතියකටවත් පෙර ප්‍රවේශපත්‍රය, නොලැබුණහොත්, එකී දහම් පාසැල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකදී ම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය :

1. විභාගයේ නම :————.
2. දහම් පාසැලේ නම :————.
3. දහම් පාසැලට ලබා දී ඇති පරිගණක අංකය :————.
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :————.
6. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
7. ලියාපදිංචි කළ අංකය හා දිනය :————.
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය :————.

8. *අනන්‍යතාව.*—එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපතිට පිළිගත හැකිවන පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ ;

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,

8.3 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත.

8.4 තැපැල් හැඳුනුම්පත

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.*—මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතු ය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බලපැවැත්වේ). ඌන සාමාර්ථය ලබන සිසුන් ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන් ම ඌන සාමාර්ථය ලැබූ විෂයයට පමණි.

9.1 පෙනී සිටින සෑම විෂයයකටම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමිවන අතර ලබා ගන්නා එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාසයන් පහත සඳහන් පරිදි වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0 - 34 | අසමත් | F |
| 35 - 54 | සමත් | S |
| 55 - 69 | සම්මාන | C |
| 70 - 100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයැදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසැල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*—මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුට ම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දහම් පාසැල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබාදෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයෙක් වේ නම්, ඒ පිළිබඳව දහම් පාසැල් ප්‍රධානාචාර්ය මගින්ම විභාග කොමසාරිස් ජනරාල්, ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතු ය.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය.*—දහම් පාසැල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම් මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතු ය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2013 ඔක්තෝබර් මස 01 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

*1 වැනි උපලේඛනය*

දිස්ත්‍රික්ක හා දිස්ත්‍රික්ක අංකත්, විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංකත් පහත දැක්වේ :-

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| *දිස්ත්‍රික්කය — කොළඹ 01* | |
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| ගල්කිස්ස | 104 |
| බම්බලපිටිය | 105 |
| දෙහිවල | 106 |
| නුගේගොඩ | 107 |
| මොරටුව | 108 |
| පිළියන්දල | 109 |
| හෝමාගම | 110 |
| මහරගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |
| *දිස්ත්‍රික්කය — ගම්පහ 02* | |
| ගම්පහ | 213 |
| මිනුවන්ගොඩ | 214 |
| මීරිගම | 215 |
| වේයන්ගොඩ | 216 |
| මීගමුව | 217 |
| වත්තල | 218 |
| කැළණිය | 219 |
| *දිස්ත්‍රික්කය — කළුතර 03* | |
| කළුතර | 320 |
| පානදුර | 321 |
| හොරණ | 322 |
| මතුගම | 323 |
| අළුත්ගම | 324 |
| මීගහතැන්න | 325 |
| *දිස්ත්‍රික්කය — මාතලේ 04* | |
| මාතලේ | 426 |
| ගලේවෙල | 427 |
| නාඋල | 428 |
| ලග්ගල - පල්ලේගම | 429 |
| දඹුල්ල | 430 |
| *දිස්ත්‍රික්කය — මහනුවර 05* | |
| මහනුවර | 531 |
| කටුගස්තොට | 532 |
| තෙල්දෙනිය | 533 |
| වත්තේගම | 534 |
| ගලහ | 535 |
| නුගවෙල | 536 |
| ගලගෙදර | 537 |
| ගම්පොළ | 538 |
| පිළිමතලාව | 539 |
| මැද මහනුවර | 540 |
| නාවලපිටිය | 541 |
| *දිස්ත්‍රික්කය — නුවරඑළිය 06* | |
| නුවරඑළිය | 642 |
| හැඳුනුවැව | 643 |
| හැටන් | 644 |
| ගිනිගත්හේන | 645 |
| හඟුරන්කෙත | 646 |
| වලපනේ | 647 |
| *දිස්ත්‍රික්කය — ගාල්ල 07* | |
| ගාල්ල | 748 |
| අම්බලන්ගොඩ | 749 |
| ඇල්පිටිය | 750 |
| උඩුගම | 751 |
| අහංගම | 752 |
| බද්දේගම | 753 |
| බලපිටිය | 754 |
| *දිස්ත්‍රික්කය — මාතර 08* | |
| මාතර | 855 |
| වැලිගම | 856 |
| කඹුරුපිටිය | 857 |
| හක්මණ | 858 |
| දික්වැල්ල | 859 |
| අකුරැස්ස | 860 |
| දෙනියාය | 861 |
| කොටපොල | 862 |
| *දිස්ත්‍රික්කය — හම්බන්තොට 09* | |
| හම්බන්තොට | 962 |
| වලස්මුල්ල | 963 |
| වීරකැටිය | 964 |
| තංගල්ල | 965 |
| අම්බලන්තොට | 966 |
| බෙලිඅත්ත | 967 |
| තිස්සමහාරාමය | 968 |
| අගුණකොළපැලැස්ස | 969 |
| *දිස්ත්‍රික්කය — වවුනියාව 10* | |
| වවුනියාව | 1070 |
| *දිස්ත්‍රික්කය — ත්‍රිකුණාමලය 11* | |
| ත්‍රිකුණාමලය | 1171 |
| කන්තලේ | 1172 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| *දිස්ත්‍රික්කය — අම්පාර 12* | |
| අම්පාර | 1273 |
| සේරංකඩ | 1274 |
| මහඔය | 1275 |
| දෙහිඅත්තකණ්ඩිය | 1276 |
| *දිස්ත්‍රික්කය — පුත්තලම 13* | |
| *නගරය* | *නගර අංකය* |
| පුත්තලම | 1377 |
| ආණමඩුව | 1378 |
| හලාවත | 1379 |
| වෙන්නප්පුව | 1380 |
| *දිස්ත්‍රික්කය — කුරුණෑගල 14* | |
| කුරුණෑගල | 1481 |
| පොල්ගහවෙල | 1482 |
| කුලියාපිටිය | 1483 |
| ඉබ්බාගමුව | 1484 |
| මැල්සිරිපුර | 1485 |
| හෙට්ටිපොල | 1486 |
| නිකවැරටිය | 1487 |
| මහව | 1488 |
| ගල්ගමුව | 1489 |
| *දිස්ත්‍රික්කය — අනුරාධපුර 15* | |
| අනුරාධපුරය | 1590 |
| මැදවච්චිය | 1591 |
| කැකිරාව | 1592 |
| පදවිය | 1593 |
| ගලෙන්බිඳුනුවැව | 1594 |
| තඹුත්තේගම | 1595 |
| හොරොව්පතාන | 1596 |
| නොච්චියාගම | 1597 |
| *දිස්ත්‍රික්කය — පොළොන්නරුව 16* | |
| පොළොන්නරුව | 1698 |
| මනම්පිටිය | 1699 |
| හිඟුරක්ගොඩ | 1600 |
| මැදිරිගිරිය | 1601 |
| *දිස්ත්‍රික්කය — බදුල්ල 17* | |
| බදුල්ල | 1702 |
| වැලිමඩ | 1703 |
| බණ්ඩාරවෙල | 1704 |
| පස්සර | 1705 |
| මහියංගනය | 1706 |
| ගිරාඳුරුකෝට්ටේ | 1707 |
| මීගහකිවුල | 1708 |
| *දිස්ත්‍රික්කය — මොණරාගල 18* | |
| මොණරාගල | 1809 |
| බිබිල | 1810 |
| වැල්ලවාය | 1811 |
| කතරගම | 1812 |
| දොඹගහවෙල | 1813 |
| *දිස්ත්‍රික්කය — කෑගල්ල 19* | |
| කෑගල්ල | 1914 |
| අරණායක | 1915 |
| රඹුක්කන | 1916 |
| මාවනැල්ල | 1917 |
| රුවන්වැල්ල | 1918 |
| යටියන්තොට | 1919 |
| වරකාපොළ | 1920 |
| *දිස්ත්‍රික්කය — රත්නපුර 20* | |
| රත්නපුර | 2021 |
| ඇහැලියගොඩ | 2022 |
| පැල්මඩුල්ල | 2023 |
| බලංගොඩ | 2024 |
| ඇඹිලිපිටිය | 2025 |
| රක්වාන | 2026 |
| කලවාන | 2027 |

10-612

---

## සංශෝධනය කිරීම

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2013**

2013 ජනවාරි මස 11 වැනි සිකුරාදා දින අංක 1793 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* I කොටස : (IIඅ) ඡේදයෙහි විභාග, විභාග ප්‍රතිඵල ආදිය යන කොටස යටතේ ඉහත මාතෘකාවෙන් පළ වූ නිවේදනයේ පිටු අංක 35හි 2 ඡේදය යටතේ සඳහන් පුරප්පාඩු තනතුරු පිළිබඳ තොරතුරු යටතේ ඇතුළත් පුරප්පාඩු සංඛ්‍යාවන් පහත සඳහන් පරිදි සංශෝධනය කරමි :-

| අංකය | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සංකේත අංකය |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්‍ෂ | 06 | 011 |
| 02. | ආණ්ඩුවේ රස පරීක්‍ෂක දෙපාර්තමේන්තුව | සැක කටයුතු ලේඛන පිළිබඳ සහකාර පරීක්‍ෂක | 03 | 022 |
| 03. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | භෞතික විද්‍යාඥ | 15 | 092 |
| | | ඖෂධ විශ්ලේෂක (රසායන විද්‍යා) | 02 | 093 |
| | | ප්‍රාදේශීය මැලේරියා මර්ධන නිලධාරි | 03 | 099 |
| | | රසඥ | 01 | 910 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

10-613

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.